සිෆ්ලෝන් ඖෂධ සමාගම
SIFLON DRUGS LTD.

විකල්පයේ මාතෘකාව: ප්ලැනටර් කුලර් (Planetary Cooler) බකට් එලිවේටර්ස් (Bucket Elevators) සහ කුෂර (Crusher) / රොල්ස් ප්‍රෙස් (Roller Press) යන්හි තාක්‍ෂණික වර්ධනය

සාරාංශය

පෞද්ගලික අයිතියක් ඇති සමාගමක් වන සිෆලොන් ඩ්‍රග්ස් වාර්ෂිකව දළ වශයෙන් ටොන් 37 ක සත්ත්ව බෙහෙත් නිෂ්පාදනය කරයි. එසේ වුවත් සමාගමේ නිෂ්පාදන ධාරිතාව වසරකට ටොන් 72 කි. ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ අනන්තපූර් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම කර්මාන්තශාලාව කුඩා ප්‍රමාණයේ එකකි. මෙම කර්මාන්තය 1999 යේදී පිහිටුවනු ලැබූ අතර සේවකයන් 40 කින් සමන්විතය. කෙසේ වුවත් සේවකයන්ගෙන් 50% ක් පමණ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරයි. මෙම සමාගම දෛනිකව (පැය 24) සේවා මුර 3 ක් යටතේ වර්ෂයකට දින 330 ක් ක්‍රියාත්මක වේ. මෙම නිෂ්පාදනාගාරයට ඔක්ෂික්ලෝසනයිට් (Oxyclozanide), රෆොක්සනයිඩ් (rafoxanide), ක්ලෝසන්ටෙල් (Closantel), ක්ලොසන්ටෙල් සෝඩියම් (closantel sodium), නික්ලෝසනයිඩ් (niclosamide) ආදි වශයෙන් වර්ග 4-5 ප්‍රමාණයක් සත්ත්ව බෙහෙත් නිපදවීමේ හැකියාව ඇත. මෙම කර්මාන්තය තවදූරටත් ව්‍යාප්ත කිරීමේ අදහසින් සිටින අතර වර්ෂයකට ටොන් 120 දක්වා ධාරිතාවය වැඩි කිරීමේ දළ සැකසුම් සමාගම සතුව ඇත. නිෂ්පාදනය කරන බෙහෙත් අතුරින් 80% ක් විතර අපනයනය කරයි. පසු ගිය වර්ෂ 3, 4 ඇතුලත බලශක්තීන් සඳහා වු වියදම වැඩි වී ඇති බැවින් සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වැය වන මුදලින් බල ශක්ති සඳහා වැයවන ප්‍රතිශතය සීඝ්‍ර ලෙස ඉහල යමින් පවතී. නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීමට අදහස් කරන බැවින් බලශක්ති කාර්යක්‍ෂමතාවය පිළිබඳ අධ්‍යනය කිරීමට අභ්‍යන්තරයෙන්ම කණ්ඩායමක් පත් කිරීමට සමාගමට අවශ්‍ය වී ඇත. GERIAP ව්‍යාපෘතිය සමග සම්බන්ධවීමේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන්නේ ඉහත කී බලශක්ති කාර්යක්‍ෂමතාවය පිළිබඳ කලයුතු අධ්‍යනයයි.

ප්‍රධාන වචන

ඉන්දියාව , රසායනික ද්‍රවය, සිසිල්කරණ (Coolers), එලිවේටර්ස් (Elevators), ප්‍රෙස් (Press)

නිරීක්‍ෂණයන්

දැනට තිබෙන ප්ලැනටරි සිසිල්කරණයේ (Planetary Cooler) ක්‍රියාන්විත කාර්යක්‍ෂමතාවය පහළ මට්ටමක තිබූ අතර නඩත්තු කටයුතු ආශ්‍රිත ප්‍රශ්ණ රාශියක් පැවතිනි. ලගා විය යුතු ද්විතීයික වායු උෂ්ණත්වය වන 1200 C^0 ලගා වීමට දැනට ඇති ප්ලැනටරි සිසිල්කරණයට හැකියාවක් නොතිබිණි. අමු ද්‍රව්‍ය මිශ්‍රණය රෝල් මිල් එකේ සිට සයිලෝස් දක්වා ගෙන යන සිරස් වායු පොම්ප විශාල බලශක්ති ප්‍රමාණයන් පරිභෝජනය කරනු ලැබීය. එසේම හැමර් කුෂර් යන්ත්‍රයද බලය විශාල වශයෙන් පාවිච්චි කරන අතරම නිෂ්පාදන අමුද්‍රවයන්හි විවිධ වෙනස්කම් උත්පාදනය කිරීම මගින් මිල් වල ක්‍රියාකාරිත්වය වඩාත් අපහසු මෙන්ම මිල අධික බවට පත් කරයි.

විකල්ප

(i) පවත්නා වින්ටේජ් පැලැටනරි සිසිල්කරණ (Vintage Planetary Coolers) වෙනුවට අධි තාක්‍ෂණික, නවීන පන්නයේ ග්‍රේට් සිසිල්කරණ (Grate Coolers) භාවිතා කිරීම මගින් ප්‍රශස්ත ද්වීතීයික වායු උෂ්ණත්වයන් කෙරෙහි ලගා වීම හා තාප කාර්යක්‍ෂමතාවයන් ඇති කිරීම

(ii) නිශ්චිත විද්‍යුත් පරිභෝජනය හා අඩු බලශක්ති පිරිවැයක් ඇති බකට් එලිවේටර් (Bucket Elevator) පද්ධතියක් සිරස් වායු පොම්ප වෙනුවට යොදා ගැනීම.

(iii) බලශක්ති පරිභෝජනය අවම කිරීමට හා මිල් එකේ අභ්‍යන්තර ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා මිල්වලට ඇතුළු කිරීමට පෙර ක්‍රෂර් යන්ත්‍ර අධි පීඩන රෝලර් ප්‍රෙස් මගින් විශාල කරවීම, CP-EE කණ්ඩායම විසින් යෝජනා කෙරුණි.

ප්‍රතිඵල

මූල්‍යමය ප්‍රතිපාදනවල මඳ බව දක්වමින් ඉහත යෝජනා සියල්ලම කළමනාකාරිත්වය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඉහත සෑම විකල්පයක් සඳහාම ඇමරිකානු ඩොලර් මිලියන 0.5 -1 පමණ සීමාවක් වසර 3-5 දක්වා විවිධ විය හැක. තාක්ෂණික වශයෙන් ක්‍රියාවට නැංවීමේ හැකියාව සළකා බැලීමේදී , ඉහත සෑම විකල්පයකටම උපරිම ලකුණු ලැබුණි. අනාගත ව්‍යාප්ති ව්‍යාපෘතියන්හිදී මෙම විකල්ප සලකා බලන බව සඳහන් කෙරුණි.

වැඩි විස්තර සඳහා

Mr. A. K. Asthana, Group Head Energy Management
Dr. P. K. Gupta, Director, NCPC-India
National Productivity Council,
5-6, Institutional Area, Lodi Road, New Delhi - 110003
Ph : 0091 – 11 – 24697446 , Fax : 0091 – 11 - 24698138
Em@il: ak.asthana@npcindia.org, ncpc@del2.vsnl.net.in

Disclaimer:

While reasonable efforts have been made to ensure that the contents of this publication are factually correct, UNEP does not accept responsibility for the accuracy or completeness of the contents, and shall not be liable for any loss or damage that may be occasioned directly or indirectly through the use of , or reliance on, the contents of this publication.